# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2206/19 - 2020 දෙසැම්බර් මස 18 සිකුරාදා - 2020.12.18**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**

3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ වූ නියමය

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මා විසින්, සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගමට අදාළව 2016 ජූලි මස 04 වැනි දින අංක 1974/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ*, 2017 දෙසැම්බර් මස 15 වැනි දින අංක 2049/59 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සහ 2018 මාර්තු මස 16 දින අංක 2062/47 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ ප්‍රකාශයට පත්කරන ලද පසුකාලීන නියම මගින් සංශෝධිත 2012 දෙසැම්බර් මස 19 වැනි දින අංක 1789/22 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ පළ කරන ලද නියමයට තවදුරටත් වශයෙන්. මෙම නියමය මගින් -

> 2016 ජූලි මස 04 වැනි දින අංක 1974/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ*, 2017 දෙසැම්බර් මස 15 වැනි දින අංක 2049/59 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සහ 2018 මාර්තු මස 16 දින අංක 2062/47 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ පළකරන ලද පසුකාලීන නියම මගින් සංශෝධිත 2012 දෙසැම්බර් මස 19 වැනි දින අංක 1789/22 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ (4) වන වගන්තිය, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රදානය කරන ලද කාලසීමාව දීර්ඝ කිරීමේ අරමුණින් යුතුව පහත දැක්වෙන ලෙස කියවෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ, එනම් -
>
> (4) "බස්නාහිර පළාතේ අංක 116, ගාලු පාර, කොළඹ 03 යන ස්ථානයේ පිහිටි සේවා මහල් නිවාස 90 කින් යුත් කාමර 475ක් සහිත නගර හෝටලයක් ඉදිකර පවත්වාගෙන යෑම සඳහා වූ ඉහත කී ව්‍යාපෘතිය විසින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ව්‍යාපෘති ගිවිසුම අත්සන් කිරීමේ දිනය වන 2012 ජූලි මස 19 වැනි දින සිට ආරම්භව 2022 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන මාස එකසිය විසිපහක (125) කාලසීමාවක් ඇතුළත ස්වකීය වානිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කරනු ලැබිය යුතුය ."

**මහින්ද රාජපක්ෂ**
මුදල් අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 18 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

01 - 620


1A - PG 5269 — 550 (2021/01)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*